ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 3 වන මට්ටම

දෙවන අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය - **2008 / 2009**

ශ්‍රී ලංකාවේ නීතිය පිළිබඳ හැඳින්වීමක් - **LWU 1411**

කාලය – විනාඩි 40 යි

---

දිනය: **26. 11. 2008** වේලාව: පෙ. ව. **11.00** සිට **11.40** දක්වා

---

එක් ප්‍රශ්ණයකට පමණක් පිළිතුරු සපයන්න

අපැහැදිලි අත් අකුරු වලට ලකුණු අඩු කරනු ලැබේ

1. " ඉංග්‍රීසි නීතිය කෙරෙහි තිබූ පක්ෂපාතිභාවය නිසා යටත් විජිත පාලනයේ බ්‍රිතාන්‍ය යුගයේ සිටි සමහර විනිශ්චයකාරවරු රෝම ලන්දේසි නීතිය වෙනුවට ඉංග්‍රීසි නීතිය අදාල කිරීම යුක්ති සහගත කිරීම සඳහා විවිධහේතු දැක්වූහ."

   යටත් විජිත පාලනයේ බ්‍රිතාන්‍ය යුගයේදී රෝම ලන්දේසි නීතිය පිළිබඳ අධිකරණ ආකල්පය අනුසාරයෙන් මෙම ප්‍රකාශය සාකච්ජා කරන්න.

2. දේවන් **1965** දී ද්‍රවිඩ දෙමාපියන්ට දාව ගාල්ලේදී උපන්නේය. **1983** දී සිදු වූ ජාතිවාදී කෝලාහලවලින් පසුව දේවන්ගේ දෙමාපියන් ඔහුද සමඟ යාපනයට ගොස් එහි පදිංචි වූහ. දේවන් යාපනයේ පාසලකට ඇතුලත් කරන ලදි. වර්ෂ **1985** දී ඔහු පේරාදෙනිය විශ්ව විද්‍යාලයට ඇතුලත් විය. විශ්ව විද්‍යාල අධ්‍යාපනය අවසන් වීමෙන් පසු ඔහු වව්නියාවේ පිහිටි ප්‍රසිද්ධ මූල්‍ය සමාගමක කළමනාකරුවකු වශයෙන් සම්බන්ධ විය. වර්ෂ **1995** දී වව්නියාවේ ද්‍රවිඩ තරුණියක වූ කමලානි සමඟ විවාහ විය. විවාහයෙන් පසු ඔවුහු යාපනයේ පිහිටි ඔහුගේ දෙමාපියන්ගේ නිවසේ පදිංචි විය. එම විවාහය කරණකොට ඔවුනට ගීතා නම් දැරියක ලැබුණි. වර්ෂ **1998** දී ගීතා ඉපදීමෙන් පසු රැකියාවෙන් ඉවත් වූ දේවන් යාපනයෙන් පිට විය. කොළඹට පැමිණි ඔහු රක්ෂණ සමාගමක මානව සම්පත් කළමනාකරුවකු වශයෙන් සම්බන්ධ විය. ඔහු පවුලේ අය බැලීමට යාපනයට ගිය අතර නිරන්තරයෙන් ඔවුනට මුදල්ද යැවිය. සිය පවුල කොළඹට ගෙන ඒමට තීරණය කළ ඔහු දෙහිවලින් කුඩා නිවසක් මිලදී ගත්තේය. වර්ෂ **2001** ඔහු යාපනයේ පිහිටි ඔහුගේ සියළුම දේපල විකුණන ලදි. වර්ෂ **2003** දී ගීතා කොළඹ පිහිටි ප්‍රසිද්ධ බාලිකා පාසලකට ඇතුලත් කරන ලදි. වර්ෂ **2008** දී කාර්යාලයට යමින් සිටින අතරතුර හදිසියේම දේවන් මිය ගියේය.

   දේවන් පාලනය වූයේ තේසවලමේ නීතියෙන්ද එසේත් නැත්නම් සාමාන්‍ය නීතියෙන්ද යන්න කමලානි ඔබෙන් විමසයි. ඇයට උපදෙස් දෙන්න.

- සියළුම හිමිකම් ඇවිරිණි -